## 22. ශීර්ෂ 20 - මැතිවරණ දෙපාර්තමේන්තුව

### 22.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 18 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

### 22.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

සේවයෙන් පහ කළ නිලධාරින් තිදෙනෙකුගෙන් හා සේවය හැර ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.178,049 ක් හා රු.254,771 ක් 2015 මාර්තු 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

### 22.3 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම.**

2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ප්‍රධාන කාර්යාලයේ හා මාතර කාර්යාලයේ පිළිවෙලින් අයිතම 08 ක හා අයිතම 01 ක උ[නතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 22.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 763(ඇ) | - | පහසුවෙන් හා නොපමාව හරි වැරදි බැලිය හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ පැවැති භාණ්ඩ ක්‍රමානුකූලව පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | 2014 ජනවාරි 29 දිනැති අංක පී.සී.ඊ/2013/4 දරන මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය | 453,264 | මැතිවරණ කාර්යයන් සඳහා කොළඹ දිස්ත්‍රික් කාර්යාල ය විසින් ආහාර මිලදී ගැනීමේදී තෝරා ගත් ලංසුකරුවන් තිදෙනෙකු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. |

**22.5** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු.**

**ගැලපුම් කළයුතු ශේෂ**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ එකතුව ර`.111,472 ක් වූ චෙක්පත් 101 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**22.6** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2014 ඔක්තෝබර් 08 දින ගම්පහ මැතිවරණ කාර්යාලයේ ගරාජයක් ඉදිකිරීම පිළිබඳව සිදු කළ භෞතිකව පරීක්ෂාවේදී වර්ග අඩි 931 ක ප්‍රමාණයට interlocking paving blocks ඇතිරීම සඳහා රු.195,510 ක් ගෙවා තිබුණි. නමුත් වර්ග අඩි 790.41 ක ප්‍රමාණයට පමණක් ගල් අතුරා තිබුණු බැවින් රු.29,610 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**22.7** **අවිධිමත් ගනුදෙනු**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දෙවන මහලේ පරිගණක අංශය හා මැතිවරණ කොමසාරිස්වරයාගේ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය ඇළුමිනියම් යොදා පාටිෂන් කිරීම පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් විධිමත්

ගිවිසුමකට එළඹිය යුතු වුවත්, ඉහත සඳහන් වැඩය සඳහා එසේ ගිවිසුමකට එළඹීමකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත රු.1,076,768 ක් ගෙවා තිබුණි.

(ආ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව වැඩ සඳහා වූ යම් කොන්ත්‍රාත්තුවක් ඉටු කිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුමේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කළ හොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 5 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවත්, රු.53,838 ක් වටිනා කාර්යසාධන සුරක්ෂණයක් දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවද, ඉහත සඳහන් වැඩය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

## 22.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 42 | 36 | 06 |
| (ii) තෘතියික මට්ටම | 17 | 06 | 11 |
| (iii) ද්විතියික මට්ටම | 479 | 370 | 109 |
| (iv) ප්‍රාථමික මට්ටම | 161 | 145 | 16 |
| **එකතුව** | **699** | **557** | **142** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 142 ක් පිරවීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.